වැසි වනාන්තර සුරකින්නෝ

http://www.RainforestProtectors.org
RainforestProtectors@Gmail.com
දු.අ. 0773486568

07/10/2015

ප්‍රාදේශීය ලේකම්, කුරුවිට

## <u>බොපත් ඇල්ල අවට කසළ ගැටලුව විසඳීම සඳහා යෝජනා</u>

දේශීය සංචාරකයින් අතර ඉතා ජනප්‍රිය බෝපත් ඇල්ල මෙම සංචාරකයින් ගෙන එන අපද්‍රව්‍ය නිසාම විනාශ වී යන බව නිසැකවම පෙනෙන කරුණකි. මේ නිසා මෑතක සිට බෝපත් ඇල්ල මහජනතාව අතර බෝතල් කටු ඇල්ල නමින් ප්‍රසිද්ධ වී ඇත. වැසිවනාන්තර සුරකින්නෝ සංගමය විසින් 2015 අප්‍රේල් මස 25 වැනි දින බෝපත් ඇල්ල පවිත්‍ර කිරීමක් හා අවට ජනතාව දැනුවත් කිරීමක් කර බෝතල් විශාල ප්‍රමාණයක් හොරණ පිරමල් සමාගමට ප්‍රතිචක්‍රීකරණය සඳහා දෙන ලදි. නමුත් පස් මසක් ඇතුලත මෙම සුන්දර දිය ඇල්ල නැවතත් ප්ලාස්ටික්, පොලිතීන් හා බොතල් විසි කර දමා අපවිත්‍ර කර ඇත. අපේ සුන්දර මව්බිම පිරිසිදුව තබා ගැනීම පරිසරවේදීන්ගේ යුතුකමක් නොව, සියලු පුරවැසියන්ගේ යුතුකමක් බව සමහර විනෝද ගමන් යන දේශීය සංචාරකයින්ට අවබෝධ නොවීම ඉතා කණගාටුදායකය.

බෝපත් ඇල්ල රැක ගැනීමට නම් මහජනතාව දැනුවත් කිරීම පමනක් ප්‍රමාණවත් නොමැති බම පැහැදිලිය. එම නිසා පහත යෝජනා ඔබගේ අවධානය පිනිස අප යොමුකර සිටිමු.

1. බෝපත් ඇල්ලට අපද්‍රව්‍ය එකතු වන්නේ එහි ඉදිරිපිට ඇති උද්‍යානය තුලට ගෙන එන කෑම සහ බීම නිසාය. එබැවින් උද්‍යානය තුලට කෑම බීම ගෙන ඒම තහනම් කල යුතුය. කෑම බීම අනුභව කිරීමට රථගාල තුල ඇති අතිරේක භූමි ප්‍රදේශයේ පහසුකම් සැලසිය යුතුය.

2. බෝපත් ඇල්ල පිරිසිදුව තබා ගැනීමට වැය වන මුදල් සඳහා ඇතුල්වීමේ ගාස්තුව සාධාරණ ප්‍රමාණයකින් ඉහල දැමිය යුතුය.

3. අතිරේක ආරක්ෂක නිලධාරීන් යොදවා උද්‍යානය තුල මත්පැන් පානය කරන හා කසළ වලින් අපවිත්‍ර කරන පුද්ගලයින්ට එරෙහිව ක්ෂණික දඩ ගැසීමක් කල යුතුය.

4. ඉහත කාරණා සම්බන්ධව ජනතාව දැනුවත් කර, බෝපත් ඇල්ල රැක ගැනීමට ඔවුන්ගේ සහයද ඉල්ලා සංඥා පුවරු සවිකල යුතුය.










පිටපත් : සභාපති, කුරුවිට ප්‍රාදේශීය සභාව , ඕ.අයි.සී. කුරුවිට පොලීසිය , මධ්‍යම පරිසර අධිකාරිය

වැසිවනාන්තර සුරකින්නෝ

http://www.RainforestProtectors.org